කැලණිය විශ්වවිද්‍යාලය - සමාජීය විද්‍යා පීඨය

2017/2018 අධ්‍යයන වර්ෂය

ශාස්ත්‍රවේදී ගෞරව උපාධි තෙවන වසර

පළමු අර්ධ වාර්ෂික පරීක්ෂණය - (2019 ජූලි/අගෝස්තු

ආර්ථිකවිද්‍යාව

ECON 41414/SOST 41434 : සංවර්ධන ආර්ථිකවිද්‍යාව

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. සම්භාව්‍ය ආර්ථික වර්ධන ආකෘතීන්ට වඩා නව සම්භව්‍ය ආර්ථික වර්ධන ආකෘති වඩාත් සූක්ෂම ආර්ථික විශ්ලේෂණයක් වීමට බලපෑ ප්‍රධාන කරුණු විමර්ශනය කරන්න.

02. ආර්ථිකයක් ක්‍රමයෙන් වර්ධනය වන විට භෞතික ප්‍රාග්ධනයට වඩා මානව ප්‍රාග්ධනයේ කාර්යභාරය වැදගත් වන්නේ කෙසේදැයි ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන ක්‍රියාවලියට අධ්‍යාපනය මගින් සිදුකරන ලද දායකත්වය ඇසුරෙන් විමසන්න.

03. ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය විස්තර කිරීම සඳහා ඔබ කැමති ඕනෑම ආර්ථික වර්ධන ආකෘතියක් යොදාගැනීමේදී මතුවිය හැකි ගැටලු හඳුනාගෙන ඒවා විසඳීම සඳහා සුදුසු යෝජනා ඉදිරිපත් කරන්න.

04. අඩු දියුණු රටවල ආර්ථික සංවර්ධනය මැනීම සඳහා යොදාගත හැකි සම්ප්‍රදායික නොවන මිණුම් හඳුනාගෙන ඒවා ඇසුරෙන් ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය පිළිබඳ ඇගැයීමක් කරන්න.

05. "සංවර්ධනය හුදෙක් ' සංකල්පයක් පමණක් ' වන්නේ එය ද්‍රව්‍යාත්මක අරමුණු මුදුන් පමුණුවා ගැනීම ඉක්මවා ගිය මානව කේන්ද්‍රීයවාදී අධ්‍යාත්මික අරමුණු ඉටුකර ගැනීමට දරණ ප්‍රයත්නයක් බැවිනි." සාකච්ඡා කරන්න.

06. සංවර්ධිත සහ අඩු සංවර්ධිත පරතරය සමාන්තරව පවත්වා ගැනීමට ක්‍රියාවලියක් ලෙස පරිධියේ සිට කේන්ද්‍රීය වෙත සම්පත් ගලායාමේ ක්‍රියාවලිය ආපසු හැරවීම සඳහා සුදුසු ආකෘතියක් පිළිබඳ තර්කානුකූල අදහස් ඉදිරිපත් කරන්න.

07. තාක්ෂණය සහ අධ්‍යාපනය භාවිතය සහ හැසිරවීම අනුව සංවර්ධන ඉලක්ක සපුරාගැනීමට ඉවහල් වන බාධාකාරී සාධක අඩු දියුණු රටවල් ඇසුරෙන් විවේචනාත්මකව පැහැදිලි කර තාක්ෂණික දියුණුව නවීන සංවර්ධන ක්‍රියාවලියට දායක කර ගත හැකි ආකාරය ශ්‍රී ලංකාව ඇසුරෙන් විමසන්න.

08. ශ්‍රී ලංකාවේ පවතින කාලීන සංවර්ධනාත්මක ගැටලු නිර්මාණය වීමට ප්‍රතිපත්ති සකස් කරන ආයතන සහ ඒවා ක්‍රියාත්මක කරන ආයතනවල ක්‍රියාකාරීත්වය බලපාන ආකාරය විග්‍රහ කරන්න.

කැලණිය විශ්වවිද්‍යාලය - සමාජීය විද්‍යා පීඨය

2017/2018 අධ්‍යයන වර්ෂය

ශාස්ත්‍රවේදී ගෞරව උපාධි තෙවන වසර

පළමු අර්ධ වාර්ෂික පරීක්ෂණය - (2019 ජූලි /අගෝස්තු)

සමාජ සංඛ්‍යානය

SOST 41444: ප්‍රජාවිද්‍යාත්මක ශිල්පක්‍රම

**<u>පළමු ප්‍රශ්නය ඇතුළුව</u> ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න**

ප්‍රශ්න සංඛ්‍යාව : 07යි. කාලය : පැය 03යි.

---

01. එක්තරා රටක සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සඳහා සාමාජික සාමාජිකාවන් අඛණ්ඩව වසර 10ක් සේවා කිරීමේ කොන්දේසිය මත 2000 වර්ෂයේ දී බඳවා ගැණිනි. එලෙස බඳවා ගත් සාමාජික සාමාජිකාවන් කොන්ත්‍රාත් කාලය අවසන් වීමට පෙර සේවය අතහැර යාම පිළිබඳ පහත පරිදි ප්‍රකාශයට පත් කර තිබුණි.

| සේවය අතහැරගිය වර්ෂය | සේවය අතහැර යාමේ සම්භාවිතාව | |
|---|---|---|
| | සාමාජිකයින් | සාමාජිකාවන් |
| 0 | 0.5 | 0.5 |
| 1 | 0.65 | 0.5 |
| 2 | 0.6 | 0.55 |
| 3 | 0.5 | 0.53 |
| 4 | 0.4 | 0.6 |
| 5 | 0.3 | 0.7 |
| 6 | 0.2 | 0.65 |
| 7 | - | 0.5 |
| 8 | - | 0.4 |
| 9 | - | 0.01 |

ඉහත දැක්වෙන තොරතුරු භාවිතයෙන් ජීවන වගුවක් නිර්මාණය කර (රේඩික්ස් අගය - Radix value 1000 යැයි සලකන්න), එම ජීවන වගුව ඇසුරින්

i. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සාමාජිකයින්ගේ සහ සාමාජිකාවන්ගේ සාමාන්‍ය සේවා කාලය වෙන වෙනම ගණනය කරන්න

ii. දෙපාර්තමේන්තුවේ සිටිය යුතු සමස්ත සේවක සංඛ්‍යාව 5000ක් යැයි සලකා වාර්ෂිකව බඳවා ගත යුතු සාමාජිකයින් සහ සාමාජිකාවන් සංඛ්‍යාව වෙන වෙනම ගණනය කරන්න (ලකුණු 20)

02. i. "ජනගහනයක ප්‍රමාණය, ව්‍යුහය සහ ගතිකත්වය යන සාධක ප්‍රජාවිද්‍යාව මඟින් අධ්‍යයනය කෙරේ." මෙම ප්‍රකාශය ප්‍රජාවිද්‍යාව සම්බන්ධ විවිධ නිර්වචන ඇසුරින් විවේචනාත්මකව විමසන්න

(ලකුණු 10)

ii. A සහ B නම් වූ රටවල් දෙකක දෙන ලද වර්ෂයෙහි ජනගහනය, මරණ සහ මරණ අනුපාතිකයන් පහත වගුවේ දක්වා ඇත.

| වයස් කාණ්ඩය | A රට | | B රට | |
|---|---|---|---|---|
| | ජනගහනය (දහස්) | මරණ අනුපාතිකය | ජනගහනය | මරණ සංඛ්‍යාව |
| 10 ට අඩු | 12 | 41.67 | 20,000 | 372 |
| 10 – 20 | 30 | 10 | 30,000 | 1160 |
| 20-30 | 40 | 6.25 | 50,000 | 544 |
| 30-40 | 65 | 6.92 | 40,000 | 255 |
| 40-60 | 15 | 13.33 | 22,000 | 180 |
| 60 ට වැඩි | 8 | 83.75 | 10,000 | 200 |

ඉහත දත්ත පදනම් කර ගනිමින්,

අ) රටවල් දෙක සඳහා දළ මරණ අනුපාතිකයන් ගණනය කරන්න (ලකුණු 04)

ආ) ඍජු ක්‍රමය යටතේ A සහ B රටවල් සඳහා සම්මතකරණය කරන ලද මරණ අනුපාතික වෙන වෙනම ගණනය කර ප්‍රතිඵල අර්ථ දක්වන්න (එක් එක් රටවල ජනගහනය, සම්මත ජනගහනය ලෙස සලකන්න) (ලකුණු 06)

03. i. ශ්‍රී ලංකාවේ මෑතකාලීන වයස් පුමිතිරි පිරමිඩය තුළ ඔබට හඳුනාගත හැකි ජනගහන ව්‍යුහය පිළිබඳ ලක්ෂණ විග්‍රහ කරන්න (ලකුණු 08)

ii. රටක සමාජ ආර්ථික සැලසුම් සකස් කිරීමේදී වයස් පුමිතිරි ව්‍යුහය වැදගත් වන්නේ කෙසේදැයි විශ්ලේෂණය කරන්න (ලකුණු 05)

iii. ආදේශක සාඵල්‍යතා මට්ටම කෙටියෙන් හඳුන්වන්න (ලකුණු 02)

iv. පහත දැක්වෙන්නේ X සහ Y නැමැති රටවල් දෙකෙහි සාඵල්‍යතාවයට අදාළ තොරතුරුය. මෙම තොරතුරු භාවිතයෙන් රටවල් දෙකෙහි සාඵල්‍යතාව පිළිබඳ ඔබගේ අදහස සන්සන්දනාත්මකව විශ්ලේෂණය කරන්න (පහත තොරතුරුවලට අතිරේකව අදාළ වෙනත් ගණනය කිරීම් යොදා ගනිමින් විශ්ලේෂණය කරන්න)

| | | රට | |
|---|---|---|---|
| | | X | Y |
| දළ උපත් අනුපාතිකය | | 25.0 | 21.0 |
| සාමාන්‍ය සාඵල්‍යතා අනුපාතිකය | | 65.5 | 58.2 |
| විවාහක සාඵල්‍යතා අනුපාතිකය | | 69.0 | 60.0 |
| වයස් විශේෂිත සාඵල්‍යතා අනුපාතිකය | අවුරුදු 15-19 අතර | 6.7 | 25.3 |
| | අවුරුදු 20-24 අතර | 135.2 | 165.4 |
| | අවුරුදු 25-29 අතර | 221.1 | 164.9 |
| | අවුරුදු 30-34 අතර | 197.0 | 92.0 |
| | අවුරුදු 35-39 අතර | 133.9 | 43.4 |
| | අවුරුදු 40-44 අතර | 48.4 | 11.3 |
| දළ ප්‍රජනන අනුපාතිකය | | 1.91 | 1.18 |
| ශුද්ධ ප්‍රජනන අනුපාතිකය | | 1.33 | 1.09 |

(ලකුණු 05)

04. i. ජනගහනයේ වයස් ව්‍යුහය තීරණය කරන නිර්ණායක විමසන්න (ලකුණු 06)

ii. "මැල්තුසියානු ජනගහන උගුල තුළ ජන විකාශන සංක්‍රාන්ති න්‍යායේ විවිධ අවස්ථාවන් නිරූපණය වේ." මැල්තුසියානු ජනගහන උගුල සහ ජනවිකාශන සංක්‍රාන්ති න්‍යාය ඇසුරින් මෙම ප්‍රකාශය විමසන්න (ලකුණු 08)

ii. පහත තොරතුරු භාවිතයෙන් සරල සමාන්තර වර්ධන අනුපාතය, ගුණෝත්තර වර්ධන අනුපාතය සහ ඝාතීය වර්ධන අනුපාතය ගණනය කරන්න

N = 9.4329

2011.06.01 දිනට ජනගහනය - 20,359,439

2001.06.01 දිනට ජනගහනය - 14,846,750 (ලකුණු 06)

05. i. ජන විකාශන සංක්‍රාන්ති න්‍යායේ පසුබිම හඳුන්වා එහි ව්‍යුහය පිළිබඳ පවත්නා විවිධ මත සාකච්ඡා කරන්න (ලකුණු 06)

ii.

| වයස් කාණ්ඩය | ජනගහනය | මරණ සංඛ්‍යාව |
|---|---|---|
| අවුරුදු 0-1 අතර | 267155 | 12598 |
| අවුරුදු 1-14 අතර | 5392610 | 44060 |
| අවුරුදු 15-24 අතර | 3278238 | 7510 |
| අවුරුදු 25-54 අතර | 9318319 | 36550 |
| අවුරුදු 55-64 අතර | 2254129 | 33798 |
| අවුරුදු 65 ට වැඩි | 2166085 | 10166 |

අ) ඉහත දැක්වෙන දත්ත භාවිතයෙන් රේඩික්ස් අගය (Radix value) 100,000 යැයි උපකල්පනය කර ජීවන වගුව නිර්මාණය කරන්න (ලකුණු 08)

ආ) සකසා ගත් ජීවන වගුව භාවිතයෙන්, 55 - 64 වයස් කාණ්ඩයට වඩා ඉහළින් ජීවත්වන ජනගහනය සහ සලකා බලන ලද රටේ සමස්ත ජනගහනය කොපමණදැයි ගණනය කරන්න (ලකුණු 02)

iii. මර්ත්‍යතාවය හඳුන්වා එහි ප්‍රධාන සාධක විස්තර කරන්න (ලකුණු 04)

06. i. ශ්‍රී ලංකාවේ මධ්‍යස්ථ වයස් මට්ටමේ වෙනස්වීම් කෙරෙහි අවධානය යොමු කරමින් ජනගහනයේ ව්‍යපත්වීම පිළිබඳ විමර්ශනය කරන්න (ලකුණු 06)

ii. ජාත්‍යන්තර සංක්‍රමණවල උපතතිය සහ වර්තමාන ප්‍රවණතා භූගෝලීය කලාප, පුම්තිරිභාවය සහ ජන සංඛ්‍යාව යන සාධක කෙරෙහි අවධානය යොමු කරමින් විග්‍රහ කරන්න (ලකුණු 08)

iii. අභ්‍යන්තර සංක්‍රමණ රටා හඳුනා ගනිමින් එය කෙරෙහි බලපාන ලද සාධක විමර්ශනය කරන්න (ලකුණු 06)

07. ජනහගනය පිළිබඳව ඉදිරිපත් වී ඇති පහත සඳහන් න්‍යායන් කෙටියෙන් පැහැදිලි කරන්න

i. වාණිජවාදී න්‍යාය

ii. ප්‍රශස්ත ජනගහන න්‍යාය

iii. මැල්තුසියානු න්‍යාය

iv. සම්භාව්‍ය සහ නව සම්භාව්‍යවාදී න්‍යායන් (ලකුණු 5x4)